මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**LAE/2025/55** **2025.04.17**

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06
### තැපැල් ඡන්ද සලකුණු කිරීම - සංශෝධිත දින වකවානු

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2025 ට අදාළව තැපැල් ඡන්ද සලකුණු කිරීමට නියම කර තිබූ දින සංශෝධනය කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර ඇත.

ඒ අනුව 2025.05.06 දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළ තැපැල් ඡන්ද සලකුණු කිරීම මතු දැක්වෙන පරිදි ඒ ඒ සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලවල දී පහත සටහනේ දැක්වෙන දිනවල දී සිදු කළ යුතු බව;

| **සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලය පිළිබඳ විස්තරය** | **තැපැල් ඡන්ද සලකුණු කරන දිනය** |
|---|---|
| **සියලුම රාජ්‍ය ආයතන, පොලිසිය, ත්‍රිවිධ හමුදාව, පාසල්, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල** | **2025.04. 24, 25, 28 හා 29 දිනවල දී** |

මහනුවර දළදා දැක්ම විශේෂ රාජකාරි සඳහා යොදවන ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන්ගේ තැපැල් ඡන්ද සලකුණු කිරීම මහනුවර උසස් බාලිකා විද්‍යාලයේ පිහිටුවනු ලබන මධ්‍යස්ථානයේ දී සහ, ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ තැපැල් ඡන්ද සලකුණු කිරීම ඒ ඒ අණදෙන නිලධාරීන් විසින් නම් කරනු ලබන සහතික කිරීමේ නිලධාරීන් ඉදිරියේ දී ඉහත සඳහන් දිනවල දීම සිදු කළ යුතු බව ; හා

**2025.04.24** හා **25** දිනවල සලකුණු කරනු ලබන තැපැල් ඡන්ද අඩංගු රක්ෂිත පැකැට්ටු ඡන්දය සලකුණු කළ දිනම තැපෑලට භාර දිය යුතු අතර, **2025.04.28** හා **29** දෙදින සලකුණු කරනු ලබන තැපැල් ඡන්ද පැකැට්ටු එම දිනවල දීම සහතික කිරීමේ නිලධාරියාගේ සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට අතින් ගෙනවිත් භාර දිය යුතු බව; නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.ඒ.එල්. රත්නායක
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන්)